# සිංහරාජ වනාන්තරයේ පැවැත්මට එරෙහිව ඇති මානව ක්‍රියාකරකම්වල ස්වාභාවය පිළිබඳ අධ්‍යයනයක්

(නෙළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වාරුකන්දෙනිය ග්‍රාම නිළධාරි වසම පිළිබඳ විශේෂ අවධානයක්)


අයි.එම්.ඩී.යාපා

පරිසර කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
ireshikamaduwanthiyapa@gmail.com



ප්‍රමුඛ පදඃ වනාන්තර කලමණාකරණය, ප්‍රජා කලමණාකරණය, සංරක්‍ෂණය


## හැදින්වීම

ශාක හා සත්ව ප්‍රජාවට වාසභූමි වශයෙන් ද දේශගුණික විවිධත්වයට පැවැත්මක් ලෙසින් ද පාංශු පරිසරයේ සුරක්ෂිතතාවය වෙනුවෙන් ද වනාන්තරය තුළින් සිදුවනකාර්යභාරය පුළුල්ය. ශ්‍රී ලංකාවේ මුළු භූමි ප්‍රමාණයෙන් 13% වනජීවි ආරක්ෂිත ප්‍රදේශ වශයෙන් වනසංරක්ෂණ දෙපර්තුමේන්තුව විසින් ප්‍රකාශයට පත්කර ඇත. (නිශාන්ත, 2002).ශ්‍රී ලංකාවේ සුවිශේෂි ලෝක උරුම ස්ථාන 8 අතරින් එකම ස්වාභාවික ලෝක උරුම ස්ථානය වශයෙන් සැලකෙන සිංහරාජ වනාන්තරය ශ්‍රී ලංකාවේ තෙත් කලාපයට අයත් සදාහරිත වනාන්තරයක් වෙයි. නමුත් වර්තමානය වන විට ශ්‍රී ලංකාව විවෘත අර්ථික ප්‍රතිපත්තිය මත පිහිටා කටයුතු කිරිම මත මෙම ප්‍රදේශවල ජනතාවද මූලික වශයෙන්ම ආර්ථික ප්‍රතිලාභ අරමුණු කරගනිමින් කටයුතු කිරිම නිසාවෙන් සිංහරාජ වනාන්තරයට හානි වන තත්වයක් නිර්මාණය වී ඇත. ඉහත කරුණු මූලික කරගනිමින් සිංහරාජ වනාන්තරයේ පැවැත්මට එරෙහිව ඇති මානව ක්‍රියාකරකම්වල ස්වාභාවය හඳුනාගෙන සිංහරාජ වනාන්තරයට සිදුකරන මිනිස් බලපෑම අධ්‍යායනය කිරිම මෙම අධ්‍යානයේ දි සිදුකරනු ලැබිය.

සිංහරාජ වනාන්තරයේ ඇති වැදගත්කම පිළිබඳව කතා කිරිමේ දි මෙය පිහිටීම ගත් විට ද ඓතිහාසිකත්වය අතින් ගත් කල ද වැදගත්කමක් හඳුනාගත හැකි ය. සිංහරාජය ගාල්ල, මාතර, රත්නපුරය මෙන්ම කළුතර දිස්ත්‍රික්ක වලට මායිම්ව තිබේ.

## අරමුණු

ඉහත කරුණු මූලික කරගනිමින් සිංහරාජ වනාන්තරයේ පැවැත්මට එරෙහිව ඇති මානව ක්‍රියාකරකම්වල ස්වාභාවය කෙබඳු ද යන්න හඳුනාගෙන සිංහරාජ වනාන්තරයට සිදුකරන මිනිස් බලපෑම අධ්‍යායනය කිරිම මෙහි ප්‍රධාන අරමුණ වෙයි. සෙසු අරමුණු වශයෙන් වනාන්තරය තුළින් දෑනට ලබා ගන්නා ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනිමේදී වනාන්තරයට සිදුකරන බලපෑම අධ්‍යායනය කිරිම, සිංහරාජ වනාන්තරය ආශ්‍රිතව සිදු කර ඇති සංවර්ධන ව්‍යාප්ති හඳුනාගැනිම හා එම ව්‍යාප්තින් වනාන්තරයට සිදුකරන බලපෑම අධ්‍යයනය කිරිම, වනාන්තරය සමඟ බැදුණු මිනිසාගේ සමාජ ආර්ථික තත්වය අධ්‍යයනය කිරිම වේ. යනාදිය පෙන්වාදිය හැකිය.

## ක්‍රමවේදය

සිංහරාජ වනාන්තරයට සිදුකරන මිනිස් බලපෑම අධ්‍යයනය කිරීම සඳහා වැඩි වශයේම මිනිස් බලපෑමට ලක්වී ඇති සිංහරාජයේ තවත් එක් ගම්මානයක් වන වාරුකන්දෙනිය ගම යොදා ගන්නා ලදි. මෙම අනුව අධ්‍යයනය සඳහා ප්‍රාථමික දත්ත හා ද්විතීක දත්ත යන දත්ත දෙවර්ගය ම භාවිතයට ගන්නා ලදි. පර්යේෂණයේ නියැදිය ලබා ගැනීමට සරල සසම්භාවී නියැදි ක්‍රමය අදාළ කර ගෙන පර්යේෂණය සිදු කරන ලදි. ඒ අනුව මෙහි දී තෝරාගත් නියැදිය ලෙස නෙළුව ප්‍රදේශිය ලේකම් කොට්ඨාශයේ වාරුකන්දෙනිය ග්‍රාම නිළධාරි වසමට අයත් පුද්ගලයින් 25 සංඛ්‍යාවක් යොදාගනිමින් මෙය සරල සසම්භාවී නියැඳි ක්‍රමයකට අනුව සිදු කරන ලදි. ගුණාත්මක දත්ත ලබාගැනීම සඳහා නිරීක්ෂණය සම්මුඛ සාකච්ජා ක්‍රමය අනුගමනය කරන්නට සිදුවිය. මෙම අධ්‍යයනය සඳහා ද්විතීක දත්ත ලබා ගැනීමේ දී ඒ සඳහා පොත්පත්, සඟරා, අන්තර්ජාලය, සංචාරක මණ්ඩලයේ විවිධ ප්‍රකාශන, වර්තා ආදිය උපයෝගී කර ගැණුනි.

## ප්‍රතිඵල සාකච්ඡාව

සිංහරාජ වනාන්තරය ස්වාභාව සෞඳර්යයේ අපූර්ව දායාදයක් සේම මෙය ශ්‍රී ලංකාවට පමණක් නොව මුළු විශ්වයට ම වැදගත් වනාන්තරයකි. මෙම වනාන්තරය ලෝක උරුමයක් වුයේ ඒ නිසාවෙනි. පහතරට තෙත් කලාපයට අයත් වන සදාහරිත වැසි වනාන්තරයක් වන මෙය අද වන විට සංරක්ෂණ මට්ටමක පවතින වනාන්තරයක් ලෙස හඳුනාගැනීමට හැකිය. ලෝකය පුරාම වනාන්තර සංරක්ෂණය පිළිබඳව දැඩි අවධානයකට ලක් වූ මෙම වකවානුව තුළ සිංහරාජ වනාන්තරය ආශ්‍රිතව ද සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක වුව ද වනාන්තරයට එරෙහිව ඇති මානව බලපෑම්වල අඩුවක් දැකිය නොහැකිය. දරිද්‍රතාවය, ජනගහනය වර්ධනය වීම හා සංවර්ධන කටයුතු වේගවත් වීම වනාන්තර විනාශ වීම කෙරෙහි බලපෑ සාධක වේ. දැව ජාවාරම දැව කැපීම සත්ව දඩයම වනාන්තරයේ වටිනා සම්පත් පැහැරගෙන යෑම ආදි වනාන්තර නිතිරීති වැඩි වශයෙන් උල්ලංගනය කරණු ලබන්නේ දුගී ජනතාවයි. මෙම ගම්මානවල වැසියන් දඩයමට දක්ෂ අය බවද හඳුනාගත හැකිවිය. විශේෂයෙන් ඔවුන් කණ්ඩායම් ලෙස එකතු වී රාත්‍රි කාලයේ වැඩි වශයෙන් දඩයමට හුරුවී සිටින බව නිගමනය කල හැකි සාධක ඇත.

අද වනවිට වනාන්තර විනාශවීම කෙරෙහි බලපාන සාධකයක් ලෙස වනාන්තර සඳහා රාජ්‍ය මැදිහත්වීම හඳුනාගත හැකිය. එනම් 1972-1976 සිංහරාජ වනාන්තරයේ දැව කැපීමට තුනී ලැලි සංස්ථාවට බලය පැවරීමේ සිට පසුකාලින ව රාජ්‍ය මැදිහත් වී සිදු කරන ලද ඉදිකිරීම් අතර මාර්ග විදුලිබල ව්‍යාප්ති ආදි රාජ්‍යය මැදිහත් වීමෙන් සිදුවන ක්‍රියාකාරකම් නිසා වනාන්තරවලට සිදුවන මානව බලපෑම තිව්‍ර වී ඇති බව හඳුනාගත හැකිය.

සිංහරාජ වනාන්තරය ආශ්‍රිත ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීමේ වැඩසටහන් ලෙස දැනට එම ප්‍රදේශයේ ප්‍රධානම ජීවන උපාය මාර්ගය වන තේ කර්මාන්තය නගා සිටුවීමට අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දීමට කටයුතු කිරීම වැදගත් වේ. වනාන්තරය ආශ්‍රිත ජනතාවගේ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීමට වැඩසටහන් ක්‍රියාත්මක කල හැකිය. එම ආර්ථික වැඩසටහන් අතර මී මැසි පාලනය, සත්ව පාලනය දියුණු කිරීමට වැඩසටහන් සකස් කල හැකිය. කිතුල් කර්මාන්තය නගා සිටුවීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වනාන්තරය තුලින් කිතුල් කර්මාන්තයේ යෙදෙන අය හඳුනාගෙන ඔවුන් ලියාපදිංචි කිරීමක් සිදුකර අනවසරයෙන් වනාන්තරයට

ඇතුළු වන අයට නීතිය ක්‍රියාත්මක කිරීමට වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමුවිය යුතුය. ඊට අමතරව ගම තුළින්ම ප්‍රජාව රැස්කර ඔවුන් දැනුවත් කර වනාන්තරය තුළ අනවසර ක්‍රියාකාරකම් සිදුකරන පුද්ගලයින්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමට වැඩසටහනක් සකස් කිරීම වැදගත් වේ. මෙහි දී ග්‍රාමීය ප්‍රජා සංවර්ධනය සමඟම සම්බන්ධ වී වන සංරක්‍ෂණය සිදු කිරීම තුළින් ග්‍රාමීය ප්‍රජාවගේ ආකල්පමය වෙනසක් තුළින් වන සංරක්‍ෂණය සිදු කිරීමට හැකියාව ඇත. මෙහිදී ප්‍රජා දායකත්වය මත දැනටමත් වන ආරක්‍ෂණ වැඩසටහන් ලෙස ක්‍රියාත්මක වන වනාන්තර මායිම තුල ගස් සිටුවීමත් ,වනාන්තර සීමා මායිම් ලකුණු කිරීම ආදිය සඳහා ප්‍රජා සහභාගීත්වය ලබා ගැනිම හා ඔවුන් දැනුවත් භාවය ඇති කිරීම, ආරක්‍ෂණ වැඩසටහන් සඳහා ග්‍රාමීය ප්‍රජාවම යොදා ගනිමින් වන සංරක්‍ෂණ නිළධාරින්ගේ රාජකාරි සඳහා වැඩි දායකත්වයක් ලබා ගැනිමට වැඩපිළිවෙල සකස් කලයුතුය.

මේ යටතේ වනාන්තර හා සිංහරාජ සංරක්‍ෂණය සඳහා ග්‍රාමීය ජනතාව පෙළඹවීම සඳහා ඔවුන්ගේම නියොජිතයන්ගෙන් යුතු සංවිධාන පිහිටුවීම හා ඔවුන්ට වැඩි බලතල ප්‍රමාණයක් හිමිකර දීම වැදගත් වේ. වාරුකන්දෙනිය ග්‍රාමයට වන අඩවි කාර්යාලයක් නොමැත. ප්‍රධාන වන අඩවි කාර්යාලය පිහිටා ඇත්තේ මෙම ගම සිට කිලෝ මීටර් 10ක් පමණ දුර නෙළුව නගරයට ආසන්නවය. මෙම තත්වය මත වනාන්තරයට එරෙහිව සිදුවන ක්‍රියාකාරකම් සොයා බැලීම දුෂ්කර කාර්යයකි. මෙම තත්වය හදුනාගෙන වනාන්තර ආශ්‍රිතවම වන අඩවි කාර්යාල පිහිටුවීම වැදගත් ය. සිංහරාජ වනාන්තරයට සිදුකරන මිනිස් බලපෑම ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික පාරිසරික යන අංශ කෙරෙහි බලපෑම් කරයි. වර්තමානයේ දි මෙය ප්‍රබල ගැටළුවක් වී ඇත. එමනිසා වනාන්තර ආරක්ෂා කරගැනිමට කටයුතු කිරිමට මිනිසා පෙළබවිමට සිදුව ඇත. වනාන්තර පොදුවේ ගත්විට මිනිසාටත් පාරිසරික පැවත්මටත් ලබා දෙන ප්‍රතිලාභ ඉමහත්ය.

## ආශ්‍රිත ග්‍රන්ථ


ආරියවංශ, ශ්‍රියන්ත මොහාන්. (2008)***පරිසර අධ්‍යයනය හා සිංහරාජය.*** මරදානඃ සමීර ප්‍රකාශකයෝ.

ජයතිලක, විජය. (2000)***සිංහරාජ ආශ්‍රිත ජනකතා 2.***කොළඹඃ වනජීව උරුමභාරය.

නිරෝෂන්, ප්‍රදීප් කේ. (2009)***සිංහරාජය හා බැඳුණු ගැමිදිවිය.*** කඹුරුපිටියඃ සිසිත ප්‍රකාශකයෝ.

පෙරේරා, හර්ෂ. (2006)***සිංහරාජ සංරක්‍ෂණය.*** නුගේගොඩඃ පියසිරි ප්‍රින්ටර්ස්.

ශ්‍රී ලංකා වන සත්ව හා ස්වාභාව ආරක්‍ෂක සංගමය. (2012)***සිංහරාජය හා ඒ ආශ්‍රිත ප්‍රදේශයේ ජෛව විවිධත්වය සංරක්‍ෂණය සඳහා අත්පොත.***